සැ. යු. - 2023.11.17 දින පළ කරන ලද අංක 2359 *ගැසට් පත්‍රයේ* II,III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,360 - 2023 නොවැම්බර් මස 24 වැනි සිකුරාදා - 2023.11.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**
**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 දෙසැම්බර් මස 15 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 දෙසැම්බර් මස 01 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1- B 82518— 5,403 (2023/11)

## තනතුරු - ඇබෑර්තු

### මහනුවර මහා නගර සභාවේ ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත මුල් ළමාවිය සංවර්ධන උපකාරක නිලධාරි සේවය, GIS තාක්ෂණ සේවා නිලධාරි සේවය සහ තොරතුරු තාක්ෂණ නිපුණතා නිලධාරි සේවය ලබා ගැනීම

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත මුල් ළමාවිය සංවර්ධන උපකාරක සේවය, GIS තාක්ෂණ සේවා සේවය සහ තොරතුරු තාක්ෂණ නිපුණතා සේවය ලබා ගැනීමට නියමිත සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි සේවාවේ නාමය සඳහන් කර 2023.12.15 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මුල් ළමාවිය සංවර්ධන උපකාරක සේවය

1. මිල දී ගැනීමට නියමිත සේවාව : මුල් ළමාවිය සංවර්ධන උපකාරක සේවය (ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත)

2. දෛනික දීමනාව : දිනකට රු. 1,400.00 බැගින්

3. කායික සුදුසුකම් : අදාළ සේවාව ලබා දීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් එකවර සමත් වීම;

*හා*

අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් එකක්වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර සමත් වී තිබීම.)

* *සටහන* - **එම විභාගයන්හි දී චිත්‍ර කර්මය, සංගීතය, නැටුම් යන සෞන්දර්ය විෂයන්ගෙන් සමත්වීම විශේෂ සුදුසුකමක් වනු ඇත.**

5. වෘත්තීය සුදුසුකම් : පූර්ව පාඨශාලා අධ්‍යාපනය පිළිබඳව විවෘත විශ්වවිද්‍යාලයේ බාහිර සේවා මණ්ඩලය මගින් නිකුත් කරන පූර්ව පාසල් අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව ;

*හෝ*

ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ළමා ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි කර ඇති ආයතන මගින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව ;

*හෝ*

මධ්‍යම පළාත් සභාවේ මුල් ළමාවිය සංවර්ධන ඒකකය මගින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව ;

*හෝ*

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමත ආයතන මගින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව.

*** මෙම ඩිප්ලෝමා පාඨමාලාවේ කාල සීමාව අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩි විය යුතු ය.**

6. වෙනත් සුදුසුකම් : (i) ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

(ii) පූර්වාසන්න වසර 03 ක කාලය තුළ මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සහිත කාන්තා අයදුම්කරුවන් පමණක් විය යුතුය.

(iii) අයදුම්කාරියන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iv) සේවය ලබා ගැනීම සඳහාවන සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. වයස : සියලුම අයදුම්කරුවන් වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

8. තෝරා ගැනීමේ ක්‍රමය : සුදුසුකම්ලත් නිලධාරීනීන් පහත කොන්දේසිවලට යටත්ව තෝරාගනු ලැබේ.

1. මූලික සුදුසුකම් සපුරා ඇති අයවලුන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ලැබේ. අනතුරුව ඉන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට යොමු කරනු ලබයි.
2. සේවය ලබා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් දළ වශයෙන් දෙගුණයක් පමණ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
3. ව්‍යුහගත පරීක්ෂණයේ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සේවා සපයා ගැනීම සඳහා තෝරාගනු ලැබේ.
4. මෙම සේවා ලබා ගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් වන බැවින් රජයේ කිසිදු නිත්‍ය තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.

තොරතුරු තාක්ෂණ නිපුණතා සේවය

1. මිල දී ගැනීමට නියමිත සේවාව : තොරතුරු තාක්ෂණ නිපුණතා සේවය (ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත)

2. දෛනික දීමනාව : දිනකට රු. 2,300.00 බැගින්

3. කායික සුදුසුකම් : අදාළ සේවාව ලබාදීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

4. අධ්‍යාපන සුදුසුකම් : 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම ;

*හෝ*

2. i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් සහිත උපාධියක් ලබා තිබීම (මෙහි දී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් හෝ පරිගණක විද්‍යාව තොරතුරු තාක්ෂණය විය යුතු ය ;

*සහ*

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම ;

*හෝ*

3. i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධිය ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් උපාධියක් ලබා තිබීම ;

*සහ*

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම ;

*හෝ*

4\. i. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (NVQ 7) මට්ටම හෝ ඊට ඉහළ (NVQ) සහතික ලබා තිබීම ;

*සහ*

ii. අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක වෘත්තීය පළපුරුද්ද ලබා තිබිය යුතුය.

5\. වෘත්තීය පළපුරුද්ද : අදාළ ක්ෂේත්‍රයේ සේවා සැපයීම සම්බන්ධව පූර්ව පළපුරුද්දක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

6\. වෙනත් සුදුසුකම් : (i) ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

(ii) පූර්වාසන්න වසර 03ක කාලය තුළ මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සහිත විය යුතුය.

(iii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iv) තෝරාගැනීම සඳහාවන සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

7\. වයස : සියලුම අයදුම්කරුවන් වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

8\. තෝරාගැනීමේ ක්‍රමය : සුදුසුකම්ලත් නිලධාරිනීන් පහත කොන්දේසිවලට යටත්ව තෝරාගනු ලැබේ.

1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් තෝරාගනු ලැබේ.
2. ව්‍යුහගත පරීක්ෂණයේ ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරු, සේවා සැපයීම සඳහා යොදාගනු ලැබේ.
3. මෙම තෝරාගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක්වන බැවින් රජයේ කිසිදු නිත්‍ය තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.

## GIS තාක්ෂණ නිලධාරි සේවය

1\. මිල දී ගැනීමට නියමිත සේවාව : GIS තාක්ෂණ නිලධාරි සේවය (ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත)

2\. දෛනික දීමනාව : දිනකට රු. 1,500.00 බැගින්

3\. කායික සුදුසුකම් : අදාළ සේවාව ලබා දීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4\. අධ්‍යාපන සුදුසුකම් : විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් භූගෝල විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබිය යුතුය.

5\. වෙනත් සුදුසුකම් : (i) ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

(ii) පූර්වාසන්න වසර 03 ක කාලය තුළ මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සහිත විය යුතුය.

(iii) බඳවා ගැනීම සඳහාවන සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. තෝරා ගැනීමේ ක්‍රමය : සුදුසුකම්ලත් නිලධාරීන් පහත කොන්දේසිවලට යටත් ව සේවය තෝරා ගනු ලැබේ.

1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් දළ වශයෙන් දෙගුණයක් පමණ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වන සියලු අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතුය.

3. ව්‍යුහගත පරීක්ෂණයේ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් සේවා සපයා ගැනීම සඳහා බඳවා ගනු ලැබේ.

4. මෙම බඳවා ගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් වන බැවින් රජයේ කිසිදු තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.

*සටහන* :- මෙම සේවා සපයා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ වෙබ් අඩවියෙන් ද බාගත කරගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2023 නොවැම්බර් මස 16 වැනි දින.

11-591/1

---

**මහනුවර මහා නගර සභාවේ මහජනාධාර දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කිරීමට නියමිත ඉංග්‍රීසි මාධ්‍ය පෙර පාසල සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවා සපයා ගැනීම**

මහනුවර මහා නගර සභාවේ මහජනාධාර දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කිරීමට නියමිත ඉංග්‍රීසි මාධ්‍ය පෙර පාසල සඳහා ගුරුවරියක් වශයෙන් සේවය සැපයීමට උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙ හි ඉංග්‍රීසි මාධ්‍ය පෙර පාසල් ගුරු නාමය සඳහන් කර **2023.12.15** දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

1. මිල දී ගැනීමට නියමිත සේවාව : පෙර පාසල් ගුරු සේවය ඉංග්‍රීසි මාධ්‍ය (කොන්ත්‍රාත් පදනම මත)

2. කායික සුදුසුකම් : අදාළ සේවාව ලබා දීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

3. දෛනික දීමනාව : දිනකට රු. 1,400.00 බැගින්

4. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් සමත් වීම;

*හා*

අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් එකක්වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සමත් වී තිබීම.

* *සටහන*.- එම විභාගයන්හි දී චිත්‍ර කර්මය, සංගීතය, නැටුම් යන සෞන්දර්ය විෂයයන්ගෙන් සමත්වීම විශේෂ සුදුසුකමක් වනු ඇත.

5. වෘත්තීය සුදුසුකම් : පූර්ව පාථශාලා අධ්‍යාපනය පිළිබඳව විවෘත විශ්වවිද්‍යාලයේ බාහිර සේවා මණ්ඩලය මගින් නිකුත් කරන පූර්ව පාසල් අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව ;

*හෝ*

ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ළමා ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි කර ඇති ආයතන මගින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව ;

*හෝ*

මධ්‍යම පළාත් සභාවේ, මුල් ළමාවිය සංවර්ධන ඒකකය මගින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව ;

*හෝ*

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමත ආයතන මගින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව.

* ***සටහන.-*** මෙම ඩිප්ලෝමා පාඨමාලාවේ කාල සීමාව අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩි විය යුතුය.

6. වෙනත් සුදුසුකම් : (i) ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

(ii) පූර්වාසන්න වසර 03 ක කාලය තුළ මහනුවර මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සහිත කාන්තා අයදුම්කාරියන් පමණක් අයදුම් කළ යුතුය.

(iii) අයදුම්කාරියන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iv) සේවය ලබා ගැනීම සඳහාවන සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. වයස : සියලුම අයදුම්කාරියන් වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

8. තෝරා ගැනීමේ ක්‍රමය : සුදුසුකම්ලත් නිලධාරීන් පහත කොන්දේසිවලට යටත් ව තෝරා ගනු ලැබේ.

5. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සේවය ලබා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවෙන් දළ වශයෙන් දෙගුණයක් පමණ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

6. ව්‍යුහගත පරීක්ෂණයේ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කාරියන් වසරක කාලයක් සඳහා තෝරා ගනු ලැබේ.

7. මෙම බඳවා ගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් වන බැවින් රජයේ කිසිදු නිත්‍ය තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.

මෙම තනතුර සඳහා වන අයදුම්පත මහනුවර මහා නගර සභාවේ වෙබ් අඩවියෙන් ද බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ, නාගරික කොමසාරිස් සතුවේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු ය.

කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2023 නොවැම්බර් මස 16 වැනි දින.

11-591/2